# අහංකාර ගති ඇති බළලා

පූජ්‍යා චාන්දනී ද සිල්වා

**බළලා අනාවැකි කීමට ප්‍රසිද්ධ සත්ත්ව විශේෂයක් ලෙසින් සමාජ සම්මත පිළිගැනීමක් ඇත. බළලුන් ගේ ඉදිරිපිට හිඳ මුහුණ සේදීමෙන් අමුත්තන්ගේ පැමිණීමත් ඇඟේ දැවටීම, පාර හරහා පැනීම වැනි අවස්ථාවල ගමන බාධා බවත් බළලුන් පොර කෑම මරණයක පෙර නිමිත්තක් බවත් අත්දැකීමෙන් වාගේ දැන සිටියහ. එමෙන්ම බල්ලා මෙන් බළලා ගෙහිමියාට හිතෛෂිව ජීවත් වුයේ නැත. ඉතාම කම්මැලි ව්‍රතයකට හුරු පුරුදුව සිටින බළලුන් පිළිබඳව සත්ව චර්යාවන් පිළිබඳ විද්‍යාඥයන්ගේ අදහස කුමක්ද ? සුරතල් සතුන්ගේ චර්යාවන් පිළිබඳව පර්යේෂණයේ යෙදෙන වෛද්‍ය මාටි බෙකර් සඳහන් කරන අන්දමට.**



"බළලා එතරම් බුද්ධිමත් සතෙකු නොවෙයි කියල අපට ප්‍රතික්ෂේප කරන්න බැහැ. බොහෝ දෙනා හිතන්නේ බල්ලා තරමටම කැපී පෙනෙන දක්ෂකම් බළලුන් තුළ නැති බවයි. නමුත් ඔබ නොදැන සිටියද බළලුන්ටත් බොහෝ දේ ප්‍රගුණ කොට ඉදිරියට ගැනීමේ හැකියාව තිබෙනවා."

මිනිසා විසින් සිදු කරන සියලුම විධානයන් අකුරට ඉෂ්ට කිරීමේ කැපවීම බල්ලා තුළ සහජයෙන්ම පිහිටා ඇත.

බල්ලා මෙන්ම බළලාද සහෝදර කුලයකට අයත්ද යන ප්‍රශ්නයට මෙම විද්‍යාඥයන්ගේ කෙටිම පිළිතුර "ඔව්" යන්නයි. Complete Kitten care, belieres. ග්‍රන්ථයේ කර්තෘ මෙන්ම බළල් කුලය පිළිබඳ විශේෂඥවරියක වූ ආම් ඝෝජායි සඳහන් කරන්නේ බල්ලන් අදින් මිලියන පනහකට එපිට ජීවත් වූන "මියොසොයිඩ්"Miacoid වර්ගයේ සතෙකුට සමාන බවයි. බළලුන්ට මෙන්ම බල්ලන්ටද කොට්ට සහිත පාද දඩයම් වර්ගයේ දත් ආදී

මාටි බෙකර් මහාචාර්ය තුමා සඳහන් කරන අන්දමට යමක් අහුලා ගෙන ඒම දෙරවල් හැරීම, වැසිකිළි වල ජල සිස්ටනය ක්‍රියා කිරීම වගේම ජල කරාම ඇරීම වැනි ප්‍රායෝගික කටයුතු බළලුන්ටද පුහුණු කළ හැක. නමුත් බළලුන් තුළ තිබෙන අහංකාර ගති ලක්ෂණය නිසාම දෝ කෙනෙකුට අවශ්‍ය පරිදි නැමීමේ ඇති අකැමැත්ත තුළින් ඔවුන්ගේ දක්‍ෂකම් යටපත්ව ඇත. බල්ලන් ඊට හාත්පසින්ම වෙනස්ය. ප්‍රශංසාව ලැබීමට දැඩි කැමැත්ත නිසාම දෝ සමාන උරුමකම් ඇත්තේද ඒ නිසාම වන්නට ඇත. නමුත් බළලුන්ගේ මේ අතර වූ විශේෂත්වයක් ඇත. අදින් වසර මිලියන 3 කට පමණ පෙරාතුව සිට බළලුන් ස්වාධීන සත්ව විශේෂයක් ලෙසින් වැඩෙන්නට පටන් ගෙන ඇත.

ගෙවල ඇති දඩි වන හීලෑ සතෙකු ලෙසින්ද මිනිස් ආශ්‍රයටද බළලා පත් වන්නට ඇත්තේ මේ සංක්‍රමණය තුළදී වන්නට ඇත. සිය සිරුර තමන් විසින්ම පිරිසිදු කර ගැනීමේ ක්‍රියාවලිය නිසා බළලා ඉතා පිරිසිදුව සිටීමට කැමැති සතෙකු ලෙස නම් ලබා ඇත.

මෙම පිරිසිදු බව බළලාගේ පරිහාවයේ ලක්ෂණයකි. if only they could speak ග්‍රන්ථයේ කර්තෘ මෙන්ම ටර්ෂ් විද්‍යාලයේ පශු වෛද්‍ය විශේෂඥ නිකොලස් ඩොඩ්මන් සඳහන් කරන්නේ බළලුන්ගේ අතීත පරම්පරාව වනගතව වාසය කළහ. මේ කාල වකවානුවේ දී ඔවුන් දඩයම් කොට ගොදුරු සොයා ගත් අතර එම ගොදුරේ ගඳ ඉවත්කර ගති. සිරුරේ උෂ්ණත්වය පාලනය වන අතරම ගොරෝසු දිවෙන් ලෙව කන විට ලැබෙන සම්බාහනය බළලාගේ සිරුරට උත්තේජනයකි. මෙම ලෙවකන අවස්ථාවලදි ලෝම බළලුන්ගේ කෙලවල තැවරී බඩවැල්වලට ඇතුළු වේ. මේ නිසාම බළලුන් ඇති කරන පුද්ගලයන් විසින් පිරිසිදුව ලෝම පීරා සකස් කිරීමෙන් බළලුන්ට ලෝම ශරීරගත වීමට තිබෙන අවස්ථාවක් වළකාලිය යුතු බව පශු වෛද්‍ය රොබින් ඩෝනින් සඳහන් කරනු ලබයි.

කුප්පමේතිය (Cat Mint) දැක්ක බළල්ලු වගේ යන්න අපේ ජනවහර තුළ හොඳින් පැළපදියම් වූ වචනයකි. බළලා කුප්පමේතිය පැළෑටියට එතරම්ම ආකර්ශනයක් දක්වයි. මෙහි සත්‍යතාවක් නැතුවා නොවේ. කුප්පමේතියවල අඩංගුව ඇති 'තෙපිටාලැක්ටෝන් ' රසායනය බළලුන්ගේ උදරාබාධවලට ඉතා ගුණදායකය. බළලුන් කුප්පමේතිය වෙත ආකර්ෂණයක් දක්වන්නේ මාස හයක් පමණ ගෙවුන විටය.



**බළලා සහජ දඩයක්කාර සතෙකු වූ නිසාම දෝ සිය ජන්ම ගති අත හැරෙන්නේද නැත. ගෙදර දොර සුරතලයට හැදී වැඩී ඉස්තරම් ආහාර ලැබුනද ඉඳහිටවත් කුරුමානම් අල්ලා කුරුල්ලෙකු ලේනෙකු මියන් හෝ දඩයම් කර ගැනීමටද බළලාට අමතක වන්නේ නැත. සත්ව හැසිරීම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය රෝලන් ට්‍රප් සඳහන් කරන්නේ බළලා සිය ආහාරය දඩයම මගින් ස්වාධීන ලෙස උපයා ගැනීමට දැඩි කැමැත්තක් දක්වනු ලබයි.**

ගුණ බවක් තිබුණද කුප්පමේතිය සඳහා බළලුන්ගේ ඇබ්බැහිවීම එතරම් ගුණ නැත. සතියකට එක් වතාවකට වඩා මෙම පැළෑටිය වැඩිහිටි බළලුන්ට වුවද ගුණ නොදෙන බව පශු වෛද්‍යවරුන්ගේ අදහස වී ඇත.

බළලා සහජ දඩයක්කාර සතෙකු වූ නිසාම දෝ සිය ජන්ම ගති අත හැරෙන්නේද නැත. ගෙදර දොර සුරතලයට හැදී වැඩී ඉස්තරම් ආහාර ලැබුනද ඉඳහිටවත් කුරුමානම් අල්ලා කුරුල්ලෙකු ලේනෙකු මියන් හෝ දඩයම් කර ගැනීමටද බළලාට අමතක වන්නේ නැත. සත්ව හැසිරීම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය රෝලන් ට්‍රප් සඳහන් කරන්නේ බළලා සිය ආහාරය දඩයම මගින් ස්වාධීන ලෙස උපයා ගැනීමට දැඩි කැමැත්තක් දක්වනු ලබයි. සිය දඩයම් කර ගත් ගොදුර රැගෙන ගෙට වදින්නේ තමාගේ හපන්කම පිළිබඳව සිය හාම්පුතුන්ටත් ප්‍රදර්ශනය කිරීමට ඇති උනන්දුව නිසාම යි.

බළලුන්ගේ චර්යාවන් පිළිබඳව සත්ව චර්යාවේදීන් ඉතාම සියුම් ලෙස නිරීක්ෂණය කොට ඇත. කෝර්නල් පශු වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය කැතරින් හෝප්ට් සඳහන් කරන්නේ බළලාගේ වලිගය අදහස් ප්‍රකාශ කිරීමේ සංකේතයකට සමාන බවය.

තමාගේ සිත තුළ වූ හැඟීමක් හාම්පුතාට දැනුම් දීමට (ආහාර, ජලය, කිරි ලබා ගැනීම) අවශ්‍ය වූ විට වලිගය ඉහළට ඉසැවී ඇත. කුරුමානමක් ඇල්ලීමට යන ගමනේදී වලිගය අග වැනෙන අතර කෝපයෙන් පසුවන විට වලිගය වේගයෙන් ගස්සනු ලබයි. තවත් සතෙකු සමග සටනට වදින විට වලිගය පහතට හැරී මැද කොටස වක්‍රව ගොස් එය ලොම් වලින් පිරී යයි.

බළලුන්ගේ පුරු පුරු ගෑම (Purr)අපට ඉතාම හොඳින් හුරු පුරුදුය. ඔවුන්ගේ සිරුර තුළින් නැගෙන මේ ශබ්දය ආදරය ප්‍රකාශ කිරීමේ මාධ්‍යක් ලෙසින් සිතති. ඔවුන්ගේ මොළය තුළින් ලබා දෙන පණිවිඩයකට අනුව නැගෙන මේ පුරු පුරු (Purr ශබ්දය වේදනාව, අසනීප වැනි අවස්ථාවලදී ක්‍රියාත්මක වන බව සත්ත්ව චර්යාවන් පිළිබඳ විශේෂඥයන් විසින් හඳුනාගෙන ඇත.

ඔබේ නිවස පුරා ඇති වටිනා ගෘහභාණ්ඩ ගෙවත්තේ ගස් වල සිය නියපොතු උල්කර ගන්නා බළලුන් පිළිබඳ දර්ශනය අපට ඉතා සුලබය.

Cats on the counter ග්‍රන්ථ කර්තෘ ලැරී ලච්මන් සඳහන් කරන්නේ නිය උල් කිරීමේ දී එම සීරීම් වල බළල් නිය මගින් ශ්‍රාවය වන (Scents) ගන්ධයන් මගින් තමාගේ සීමාව ඔවුන් හඳුනාගන්නා බවයි. එසේ නම් කම්මැලි මෝඩයා යන ලේබලයෙන් බළලා නිදහස් කිරීමට දැන් කාලය එළැඹ ඇත. ❑

